www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සුනාමිය: එක්සත් ජනපද මානුෂික මෙහෙවර පිලිබඳ සිද්ධි අධ්‍යයනයක්

## The tsunami in Sri Lanka: A case study in US humanitarian missions

**කේ. රත්නායක විසිනි**
**2008 මැයි 14**

මැයි 3 දා සුලිසුලඟ බුරුමය වෙලා ගත් අවස්ථාවේ පටන්, සහන නිලධාරින් සමග විදේශ මිලිටරි හමුදාවන්ට ද එම රටට ඇතුලු වීමට ඉඩ දිය යුතු බවට බල කරමින් ජාත්‍යන්තර මාධ්‍ය අනවරත උද්ඝෝෂනයක් පවත්වා ගෙන ගොස් ඇත. නොමසුරු ලෙස මානුෂික ආධාර සැපයීමෙහි ලා එක්සත් ජනපදය හා සෙසු මහ බලවතුන් තුල ඇතැයි කියනු ලබන කැමැත්තට ප්‍රතිකූල ලෙස බුරුම ජුන්ටාව දක්වා ඇති භීතිකාව, අකාර්යක්ෂමතාව හා නොතැකීම පෙන්නුම් කරන ලිපි එකක් පිටුපසින් තවෙකක් ලෙස පල වෙයි.

මනුෂ්‍ය ජීවිත සම්බන්ධයෙන් එය අනුගමනය කරන මර්දනකාරී පියවර හා නොතැකීම බුරුම ජුන්ටාව යලිත් වරක් පැහැදිලිව ප්‍රදර්ශනය කර තිබේ. එහෙත් වොෂිංටනය හා ඔවුන්ගේ සගයන් ක්‍රියා කරන්නේ මුලුමනින් ම බුරුම ජනතාව පිලිබඳ උත්සුකතාවකින් ය යන්න සරලව ම පවයකි. ඉරාකයේ දී හා ඇෆ්ඝනිස්ථානයේ දී මෙන් ම බුෂ් පාලනාධිකාරය මෙහි දී හඹා යන්නේ ද සිය භූලෝපායික හා ආර්ථික අවශ්‍යතා ය -- බුරුමය පිලිබඳ කාරනාවේ දී, නැග එන භයානක ප්‍රතිවාදියකු වීමේ විභවයකින් යුක්ත රටක් ලෙස එක්සත් ජනපදය සලකන චීනය සමග සන්ධානගතව සිටින තන්ත්‍රයකට වල කැපීම යි.

බුරුමයට මැදිහත් වීම සඳහා තර්කයක් ගොඩනැගීමේ දී, මාධ්‍ය අටුවාකරුවන් නිරන්තරයෙන් මතු කරන්නේ 2004 සුනාමිය යි. ඔවුන් කියාපාන්නේ, විදේශ මිලිටරි හමුදා යෙදවීම ඇතුලුව එහි දී දක්වන ලද ජාත්‍යන්තර ප්‍රතිචාරය කාර්යක්ෂමතාව හා සද්ක්‍රියාව පිලිබඳ ආදර්ශයක් බව යි. 2004 දී ඇත්ත වසයෙන් ම කුමක් සිදු වුනි ද, එහි දේශපාලන ඇඟවුම් මොනවා ද සහ ජීවත් වීම සඳහා තවමත් අරගලයක යෙදී සිටින බෙංගාල බොක්ක වටා පිහිටි රටවල සිටින එයින් දිවි ගලවා ගත් විපතට පත් දස දහස් සංඛ්‍යාත ජනයාගේ ඉරනම කෙබඳුද යන කාරනා මුලුමනින් ම නොතකා හැර තිබේ.

ශ්‍රී ලංකාවේ සිද්ධිය වැදගත් පාඩම් අන්තර්ගත කර ගනී. ශ්‍රී ලංකාව යනු ඉන්දුනීසියාවෙන් පසුව සුනාමියෙන් දරුනු ලෙස ම හානි සිදු වූ රට යි. නිල සංඛ්‍යා ලේඛනවලට අනුව, අඩු ගනනේ මිනිසුන් 30,920ක් ජීවිතක්ෂයට පත්ව, 519,063ක් අවතැන් වී නිවාස 103,836ක් විනාශ විය. සිදු වූ ව්‍යසනය අති භයංකර විය. නිවාස, පාසල්, රෝහල්, මංමාවත්, දුම්රිය මාර්ග, පනිවිඩ හුවමාරු මාර්ග යන සියල්ල සෝදී ගියේ ය. ගම්මාන පිටින් අතුරුදහන් විය. දිවි ගලවා ගත්තවුන්ට හිසට සෙවනක්, ආහාර, පිරිසිදු ජලය සහ ඖෂධ අහිමි විය. බොහෝ දෙනෙකුට, විශේෂයෙන් ම ධීවරයන්ට සිය ජීවනෝපාය නැති විය.

අකාර්යක්ෂම, මර්දනකාරී පාලනාධිකාරයක් සහිත එක ම රට බුරුමය නොවේ. දින ගනනාවක් යන තෙක්, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග ආන්ඩුව කිසිවක් කලේ නැත, විශේෂයෙන් ම දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග ආතති සහගත සටන් විරාමයක් පැවති නැගෙනහිර හා උතුරු පලාත් තුල පැවතුනේ එම තත්වය යි. කොලඹ සිට එම ප්‍රදේශවලට පිරිස් වසයෙන් පැමින මංමුලාවට පත්ව සිටි දිවි ගලවා ගත්තවුන්ට මුලින් ම ආධාර සැපයුවේ, වෛද්‍යවරු හා හෙදහෙදියන් වැනි නිපුනතා සහිත අය ද ඇතුලු සාමාන්‍ය වැඩ කරන ජනතාව යි.

ආන්ඩුවේ ප්‍රතිචාරය වූයේ සොල්දාදුවන් හා හමුදාව යොදවා ස්වේච්ඡා කන්ඩායම් ද ඇතුලු සමස්ත සහන මෙහෙයුම ම මිලිටරියේ පාලනය යටතට ගෙන ඒම යි. ඔවුන්ගේ මූලික උත්සුකතාව වූයේ, යන්තම් අටවා ගැනුනු ජරාජීර්න සරනගත කඳවුරු තුල අති දුෂ්කර කොන්දේසිවලට මුහුන දෙමින් සිටි දිවි ගලවා ගත්තවුන්ට උදව් කිරීම නොව, ආන්ඩුවේ නොතැකීම හා ආධාර ප්‍රමානවත් පරිදි නොසැපයීම සම්බන්ධයෙන් පැන නැගිය හැකි මොන යම් හෝ විරුද්ධත්වයක් හෝ විරෝධයක් මැඩීම යි. අන් සියල්ලට මත් වඩා, එකිනෙකාට උදව් කරනු වස් සාමාන්‍ය සිංහල, දෙමල හා මුස්ලිම් ජනයා ඒකාබද්ධව සිටි ආකාරය, කොලඹ දේශපාලන සංස්ථාපිතය දශක ගනනාවක් තිස්සේ වාරු වී සිට ඇති දෙමල විරෝධී වර්ගෝත්තමවාදය සෘජුව ම කපා ගෙන ගියේ ය.

බුෂ් පාලනාධිකාරය ශ්‍රී ලංකාවට එක්සත් ජනපද මිලිටරිය එව්වේ මෙම සන්දර්භය තුල ය. මෙරයින් භටයන් දිවයිනේ දකුනට ගොඩබැස්සවීමට අවසර දෙන ලෙස ඉල්ලා සිටීමට තරම් වත් හිටපු රාජ්‍ය ලේකම් කොලින් පවෙල් සැලකිලිමත් වූයේ නැත. ප්‍රථම වතාවට රට තුලට ඇමරිකානු හමුදා ඇතුලු වීමට

අවසර දීම සම්බන්ධයෙන් පාලක කව තුල සිටියවුන්ගේ පවා ඇස් බැම් ඉහලට නැගුනි. ඩේලි මිරර් පත්‍රයේ කතුවැකියක් මිලිටරි මැදිහත්වීමට සැඟවුනු අරමුනු -- එනම්, මධ්‍යම ආසියාව හා මැද පෙරදිග තුල එක්සත් ජනපද අවශ්‍යතා ප්‍රවර්ධනය කර ගැනීම -- තිබුනේ ද යන වග විවෘතව ප්‍රශ්න කලේ ය.

කෙසේ වෙතත්, කුමාරතුංග ඉක්මනින් ම යටත් විය. මෙරයින් භටයන් තුන් සියයක් දිවයිනේ දකුනු පලාතට ගොඩ බස්සන ලද අතර ඔවුහු එහි මෙන් ම නැගෙනහිර පලාතේ ආරුගම් බොක්ක ප්‍රදේශයේ ද යොදවන ලදි. සහන මෙහෙයුම බෙහෙවින් සීමිත එකක් විය. සොල්දාදුවෝ සුන්බුන් ඉවත් කිරීමට උදව් කොට, සහන සැපයුම් ප්‍රමානයක් බෙදා දී, මාධ්‍ය ප්‍රචාරය සඳහා පෙනී සිට මාස ගනනාවකට පසුව ඉවත්ව ගියහ. නිසැකව ම විපතට පත්වූවන්ගෙන් සමහරෙකුට ආධාර ලැබුනා වුනත් එක්සත් ජනපද මිලිටරිය මැදිහත් කරවීමේ මූලික අරමුන දේශපාලන එකක් විය.

එම මෙහෙයුමට ගාමක කිහිපයක් ම පැවතුනිඃ එනම්, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ජනතාව අතර දශක ගනනාවක් තිස්සේ පවත්නා ගැඹුරු වෛරය ජයගැනීම සහ දැන් බුරුමය සම්බන්ධයෙන් යොදා ගැනීමට යෝජනා කෙරෙන පූර්වාදර්ශයක් ස්ථාපිත කිරීම යි. එහෙත් සමාජවාදී සමානතා පක්ෂය අනතුරු ඇඟවූයේ, අන් සියල්ලටමත් වඩා වොෂිංටනය මාන බලන්නේ පුලුල් කලාපයක් පුරා සිය ආර්ථික හා මූලෝපායික අභිලාෂයන් හඹා යනු පිනිස ශ්‍රී ලංකාව ඇතුලු රටවල් සමග සමීප මිලිටරි සබඳතා ඇති කර ගැනීමට බව යි.

## ශ්‍රී ලංකාවේ මූලෝපායික වැදගත්කම

එම අනතුරු ඇඟවීම සනාථ විය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන මූලෝපායික වැදගත්කම නම්, මැද පෙරදිග සිට මලක්කා සමුද්‍ර සන්ධිය හරහා පැසිෆික් සාගරය දක්වා වූ ප්‍රධාන මාර්ගය ඇතුලු ඉන්දියානු සාගරයේ ප්‍රධාන මුහුදු මාර්ගවලට මැදිව එය පිහිටා තිබීම යි. විශේෂයෙන් ම, නැගෙනහිර වෙරලේ පිහිටි ත්‍රිකුනාමලයේ ගැඹුරු-මුහුදු වරාය දිගු කලක් තිස්සේ වැදගත් සම්පතක් ලෙස සලකනු ලැබ තිබේ. එල්ටීටීඊය සමග 2002 සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව, එක්සත් ජනපද පැසිෆික් අන දෙන මධ්‍යස්ථානයේ ඉහල පෙලේ කන්ඩායමක් ත්‍රිකුනාමලය වරාය පිලිබඳ සවිස්තර අධ්‍යයනයක් හා එල්ටීටීඊයෙන් එල්ල විය හැකි තර්ජන ගැන තක්සේරුවක් කරනු පිනිස ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදුනි.

එම අවස්ථාවේ, බුෂ් පාලනාධිකාරය, දිවයිනේ කටුක 20 අවුරුදු සිවිල් යුද්ධය අවසන් කිරීමේ විධි ක්‍රමයක් ලෙස ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියාදාමයට ප්‍රසිද්ධියේ සහයෝගය දෙමින් සිටියේ ය. කෙසේ වෙතත්, වොෂිංටනයේ උත්සුකතාව වූයේ ශ්‍රී ලංකාවේ ජනතාවට යුද්ධය මගින් ගෙන එනු ලැබ තිබූ ව්‍යසනය නොව, යුද්ධය කලාපය තුල, විශේෂයෙන් ම ඉන්දියාව තුල, එක්සත් ජනපද අවශ්‍යතාවන්ට තර්ජන කරන අස්ථාවරකරන බලපෑමක් ඇති කිරීම පිලිබඳව ය.

කෙසේ වෙතත්, 2004 දෙසැම්බර් වන විටත් සාම ක්‍රියාදාමය පැවතුනේ බිඳ වැටීමේ අද්දරක ය. 2003 අප්‍රේල් මස සාම සාකච්ඡා බිඳ වැටුනු අතර 2004 මුල දී ජනාධිපති කුමාරතුංග "ජාතික ආරක්ෂාවට වල කැපීමේ" චෝදනාව ඉදිරිපත් කරමින්, එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව හදිසියේ ම බලයෙන් පහ කලා ය. පසුබිමින්, මිලිටරිය සහ කුමාරතුංගගේ නව ආන්ඩුවේ හවුල්කරුවකු වූ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි සිංහල අන්තවාදී පක්ෂ ඒ වන විටත් යලි යුද්ධය අරඹන ලෙස බල කරමින් සිටියහ.

එක්සත් ජනපදය සහ සෙසු මහ බලවත්තු ජාත්‍යන්තර ආධාර බෙදා හරිනු පිනිස ආන්ඩුව හා එල්ටීටීඊය අතර ඒකාබද්ධ යාන්ත්‍රනයක් සඳහා බල කරනු වස් සුනාමිය විසින් නිර්මානය කරන ලද ව්‍යසනය යොදා ගත්හ. සාම සාකච්ඡා යලි ඇරඹීම දෙසට තැබෙන ප්‍රථම පියවර ලෙස එම යෝජනාව සලකන ලදි. කුමාරතුංග තාවකාලිකව එම යෝජනාව වැලඳ ගත්තා ය. එයට ආංශික වසයෙන් හේතු වූයේ, සියලු ශ්‍රී ලාංකිකයන් එකම බෝට්ටුවකට වැටී ඇති බවත් භාතෘඝාරක යුද්ධය අවසන් කල යුතු බවත් සුනාමිය මගින් පෙන්නුම් කෙරී ඇත යන පුලුල් ජනප්‍රිය මනෝගතිය යි. කෙසේ වෙතත්, මිලිටරියේ ඉහල අන දෙන මන්ඩලය හා ජවිපෙ සැලකුවේ තාවකාලික ආධාර මන්ඩලය එල්ටීටීඊයට ලබා දෙන ඉවසිය නොහැකි සහනයක් ලෙස ය.

සුනාමිය වොෂිංටනය සමග වඩා සමීප දේශපාලනික හා මිලිටරි සබඳතා ඇති කරනු පිනිස යොදා ගත හැකි පහසු කඩතුරාවක් විය. පවෙල් විපතට පත් රටවලට කෙරෙන සිය සංචාරයේ කොටසක් ලෙස ජනවාරි මුල කොලඹට පැමිනියේ ය. අප්‍රේල් මාසයේ දී, එවකට එක්සත් ජනපද පැසිෆික් අන දෙන මධ්‍යස්ථානයේ ප්‍රධානියා වූ අද්මිරාල් විලියම් ජේ. පැලන් ශ්‍රී ලංකාවට පැමින, ආන්ඩුවේ නායකයන් හමු වී ත්‍රිකුනාමලය ඇතුලු සුනාමියෙන් හානියට පත් ප්‍රදේශවල සංචාරයක යෙදුනි. එම මාසයේ දී ම, දකුනු ආසියාව පිලිබඳ සහකාර රාජ්‍ය ලේකම් ක්‍රිස්ටිනා රොකා ඒකාබද්ධ ආධාර යාන්ත්‍රනය ගැන සාකච්ඡා කරනු පිනිස ශ්‍රී ලංකාවට පැමිනියා ය.

බුෂ් පාලනාධිකාරය පැහැදිලිව ම දෙබිඩි මූලෝපායක් අනුගමනය කරමින් සිටියේ ය. එනම්, විය හැකි යුද සැලසුම් ගැන ශ්‍රී ලංකාවේ මිලිටරිය සමග ඉහල පෙලේ පුද්ගලික සාකච්ඡා පවත්වන අතරේ ම සාම සාකච්ඡා සඳහා ප්‍රසිද්ධියේ තල්ලුව දීම යි. ඒකාබද්ධ ආධාර යාන්ත්‍රනයක් පිලිබඳ සාකච්ඡා මාස ගනනාවක් තිස්සේ දිගට ඇදුනි. මැයි 16-17 දිනවල පැවති ප්‍රධාන ආධාර දෙන රටවල හා ආයතනවල සම්මන්ත්‍රනයක් කොලඹ

ආන්ඩුවට අවසාන නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ, එක්සත් ජනපද ඩොලර් බිලියන 3ක ආධාර වැඩපිලිවෙලක් සඳහා කොන්දේසිය ලෙස ආධාර යාන්ත්‍රනය පිහිටුවන ලෙස යි.

කුමාරතුංග අකැමැත්තෙන් වුවත් එල්ටීටීඊය සමග පශ්චාත්-සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහය (පී-ටොම්ස්) පිහිටුවූවා ය. එහෙත් එය ආරම්භයේ පටන් ම අඩු කැඩුනු තාරාවෙක් විය. ජවිපෙ ආන්ඩුවෙන් ඉවත් වී පී-ටොම්ස්හි ව්‍යවස්ථානුකූල භාවය පිලිබඳව ශ්‍රේෂ්ඨාධිකරනයේ දී සාර්ථකව අභියෝග කලේ ය. ජවිපෙ, 2005 නොවැම්බර් ජනාධිපතිවරනයේ දී, පී-ටොම්ස් මුලුමනින් ම අහෝසි කරන හා යුද්ධය යලි ඇරඹීම සඳහා මාවත සකසන වැඩපිලිවෙලක් මත කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නව අපේක්ෂකයා වන මහින්ද රාජපක්ෂට සහයෝගය දුන්නේ ය.

මැතිවරනය යන්තම් ජය ගෙන බලයට පත් වූ රාජපක්ෂ, වොෂිංටනයේ නිහඬ සහයෝගය ද සහිතව, වහා ම එල්ටීටීඊය සම්බන්ධයෙන් අතිශයින් ප්‍රකෝපකාරී ආස්ථානයක් ගත්තේ ය. 2006 ජනවාරියේ දී, කොලඹ එක්සත් ජනපද තානාපති ජෙෆ්රි ලන්ස්ටඩ්, එල්ටීටීඊය සාකච්ඡා සඳහා ආන්ඩුවේ කොන්දේසි පිලිගත යුතු යැයි ඉල්ලා සිටිමින්, යුද්ධය යලි ඇරඹීම පිනිස වොෂිංටනයේ සහයෝගය පිලිබඳව සංඥාවක් දුන්නේ ය. "එල්ටීටීඊය සාමය අතහැර දැමීම තෝරා ගත හොත්, . . . වඩා ශක්තිමත් වඩා හැකියාවන්ගෙන් යුක්ත හා වඩා අධිෂ්ඨානවත් ශ්‍රී ලංකා මිලිටරියකට මුහුන දීමට ඔවුන්ට සිදු වනු ඇති බව පැහැදිලි කිරීම අපට අවශ්‍ය ය. යුද්ධයට යලි අවතීර්න වීමක වන්දිය වඩා ඉහල එකක් කිරීම අපට අවශ්‍ය ය." යනුවෙන් ලන්ස්ටඩ් අනතුරු ඇඟවී ය.

2002 සටන් විරාම ගිවිසුම විවෘතව උල්ලංඝනය කරමින් එල්ටීටීඊ-පාලිත මාවිල්ආරු ප්‍රදේශය අල්ලා ගන්නා ලෙස 2006 ජුලි මාසයේ දී රාජපක්ෂ හමුදාවට අන කල විට, ප්‍රකෝපකරනයන්ගෙන් හා ඝාතනවලින් සමන්විත සැඟවුනු යුද්ධය විවෘත යුද්ධයක් බවට පිපුරුනි. මෙම විවෘත ආක්‍රමනික ක්‍රියාවට විරුද්ධව එක්සත් ජනපදයෙන් හෝ "සාම ක්‍රියාදාමයේ" සෙසු අනුග්‍රාහකයන්ගෙන් කෙඳිරිලි සහගත විවේචනයක් වත් එල්ල නොවුනි. අද එක්සත් ජනපදයේ දේශපාලන හා මිලිටරි සහයෝගය ද සහිතව, දිවයින ම්ලේච්ඡ සිවිල් යුද්ධයක ගිලී පවතී.

ඇමරිකානු විද්‍යාඥයන්ගේ සම්මේලයේ වාර්තාවකට අනුව, ශ්‍රී ලංකාවට ඍජුව ම අලෙවි කරන ලද ආරක්ෂක ද්‍රව්‍ය ප්‍රමානය 2004 දී තිබූ එජ ඩොලර් මිලියන 1.9 සිට 2005 දී ඩොලර් මිලියන 3.1 දක්වා ද 2006 දී ඩොලර් මිලියන 3.9 දක්වා ද ඉහල නැග තිබේ. එයට හිලව් වසයෙන්, රාජපක්ෂ ආන්ඩුව ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ බුෂ් ආන්ඩුව පවත්වා ගෙන යන මිලිටරි වාඩිලැම්වලට නිහඬව සහයෝගය දෙන අතර පසුගිය වසරේ දී භාන්ඩ හා සේවා පිලිබඳ සහයෝගය ලබා ගනු පිනිස දිවයින යොදා ගැනීමේ අවසරය එක්සත් ජනපද මිලිටරියට ලබා දෙන ගිවිසුමක් අත්සන් කලේ ය.

සුනාමියෙන් විපතට පත් ජනයා සම්බන්ධයෙන් ගත හොත්, ඔවුන් මුලුමනින් ම අමතක කර දමනු ලැබ තිබේ. ආන්ඩුවේ යලි ගොඩනැගීමේ හා සංවර්ධන ඒජන්සියට (රාඩා) අනුව, මාර්තු මාසයේ දී, පවුල් 6,718ක් නැත හොත් 25,000කට වැඩි ජනතාවක් සරනගත කඳවුරුවල ජරාජීර්න කොන්දේසි යටතේ දිවි ගෙවමින් සිටියේ ය. ඒ සුනාමියෙන් වසර තුනකටත් වැඩි කලක් ගත වීමෙන් පසුව ය. එම පවුල්වලින් බොහොමයක් -- 5,280ක් -- සිටින්නේ යලි ඇරඹූ යුද්ධය ක්‍රියාත්මක වන උතුරු හා නැගෙනහිර පලාත්වල ය. කොලඹ අගනුවර වටා වූ ප්‍රදේශවල පවා පවුල් 803ක් කඳවුරුවල දිවි ගෙවයි.

මෙම නිල සංඛ්‍යා ලේඛන නිසැකව ම අවතක්සේරුවකි. එපමනක් නොව, යලි නිවාසවල පදිංචි කරවනු ලැබ ඇති අය ද ඇතුලු, සුනාමියෙන් දිවි ගලවා ගත්තවුන්ගෙන් තවත් බොහෝ දෙනෙක්, තවමත් අති මහත් ආර්ථික දුෂ්කරතාවලට මුහුන දෙයි. බොහෝ ධීවරයන්ට සිය ජීවනෝපාය අහිමි වූ අතර ඔවුන් යලි පදිංචි කෙරුනේ වෙරලට බෙහෙවින් ඈත ප්‍රදේශවල ය. ජනතාව ආරක්ෂා කිරීමේ කඩතුරාව යටතේ, සුඛෝපභෝගී හෝටල හා නිවාඩු නිකේතන සඳහා මාවත සකසා ගනු වස් ධීවර ගම්මාන ඉවත් කරනු පිනිස ආන්ඩුව අවස්ථාව ගසාකෑවේ ය.

මෙම සරනගතයන්ගේ ඉරනම වෙලුම් ගනනක් දිග කතාවක් පවසයි. නැගෙනහිර පලාතේ ග්‍රාමීය නගරයක් වන මරදමුනෙයිහි හකීම් මේ සතියේ දී *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* මෙසේ පැවසී ය: "අපේ ගමේ පවුල් 186කට සුනාමිය බලපෑවා. සුනාමිය කඩා වැදීමෙන් සිය ගනනක් මිය ගියා." සිය ගමේ කිසිවකුට නිවසක් ලැබී නැති බව ඔහු කීය. බොහෝ දෙනෙකුට පූර්න කාලීන රැකියාවක් නොමැති අතර ඔවුහු අනියම් කම්කරුවන් ලෙස සුලු මුදලක් උපයති. මරදමුනෙයි මධ්‍ය මහා විද්‍යාලය යලි ගොඩනගනු ලැබ නැත.

බටහිර පලාත තුල ද පවතින්නේ එක ම කතාව ය. කොලඹ අවට උප-නගර ප්‍රදේශයක් වන කටුබැද්දේ පිහිටි අත්හැර දමා ඇති පැරනි රජයේ ගොඩනැගිල්ලක් පවුල් 56කට වත්මන් නිවහන වී තිබේ. ගොඩනැගිල්ල අබලන් වී ඇත. එක් එක් පවුලට වර්ග මීටර් 40 කොටසක් වෙන් කර දී තිබේ. වැසිකිලි උතුරා යමින් ඇත. ආපදා කලමනාකරන අමාත්‍යාංශය අදාල බිල් ගෙවා නැති බැවින් එහි විදුලි බල සැපයුම කපා හැර තිබේ. එහි වෙසෙන එකදු වැඩිහිටියකුට වත් මනා රැකියාවක් නැත.

19 හැවිරිදි දැරියක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* මෙසේ පැවසී යඃ "ඔබ බුරුමයේ තත්වය ගැන අහනවා. අපට රූපවාහිනී හෝ වෙනත් කිසිදු ජනමාධ්‍යයක් බලන්න පුලුවන්කමක් වත් නැති නිසා එහේ මොකද වෙන්නෙ කියලා අපි දන්නෙ නැහැ. එහේ තත්වය ගැන මම දැන ගන්නෙ ඔබගෙන් විතරයි. ඒක තරමත් මීට සමාන බව පේනවා. සාමාන්‍ය මිනිස්සු ස්වාභාවික විපත්වලින් පහර කන හැටිත් පාලකයන් ඔවුන්ට සලකන හැටිත් ලෝකය පුරාම අපි දකිනවා."

එක්සත් ජනපද මෙරයින් භටයන් බොහෝ කලකට ඉහත දී ඉවත්ව ගොස්, ශ්‍රී ලංකාවට ලැබුනු ජාත්‍යන්තර සුනාමි ආධාර හිඳී ගොස් ඇති අතර ආන්ඩුව මූලික සේවාවන්ට වෙන් කෙරෙන මුදල් ප්‍රතිපාදන කපා එම මුදල් යලි ඇරඹූ යුද්ධය සඳහා යොමු කරමින් සිටී. බුරුමය සම්බන්ධයෙන් ද කතාව නිසැකව ම ඊට සමාන වනු ඇත. බුරුමයට මැදිහත්වීම සඳහා වන තල්ලුව මෙහෙයවනු ලබන්නේ, බහුතරයක් බුරුම වැසියන්ගේ අවශ්‍යතාවන්ට කෙලින් ම විරුද්ධ වන සහ නොවැලැක්විය හැකි ලෙස ම නව බේදවාචකයන් නිර්මානය කරනු ඇති මහ බලවතුන්ගේ ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා විසිනි.